www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලාංකාවේ ආන්ඩුව කප්පාදු පිලිවෙත් ක්‍රියාත්මක කිරීමෙන් පසු ජාමූඅ නය වාරිකය මුදා හරියි

## IMF releases loan after Sri Lankan government imposes austerity measures

**සමන් ගුනදාස විසිනි**

**2012 අප්‍රේල් 7**

ගෙවුම් ශේෂ අර්බුදයට පිලියමක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) විසින් ලබා දුන් ඩොලර් බිලියන 2.6 ක පොරොත්තු නය මුදලේ කොටසක් ලෙස ඇමරිකානු ඩොලර් මිලියන  426 ක වාරිකයක් මුදා හැරීමට ජාමූඅ පසුගිය අප්‍රේල් 2 දා ක්‍රියාත්මක විය. 2009 ජූලි මස සමූහ මුදල අනුමත කල ද ජාමූඅ විසින් පනවනු ලැබූ කොන්දේසි ඉටු කිරීමට ශ්‍රී ලංකා ආන්ඩුව අපොහොසත් වීම නිසා පසුගිය සැප්තැම්බරයේ දී අවසන් වාරික දෙක ගෙවීම නතර කෙරිනි.

ජාමූඅ නිකුත් කල පුවත්පත් දැන්වීමකට අනුව "ජංගම ගිනුම පියවීම, සංචිත සිඳී යාම වැලැක්වීම, හා මූල්‍ය කාර්යක්ෂමතාව ඉහල නැංවීම එල්ල කර ගත් පුලුල් පැකේජයක්" කොලඹ ආන්ඩුව විසින් හඳුන්වා දීම නිසා මෙම වාරිකය නිකුත් කිරීමට ඒජන්සිය තීන්දු කලේය. ඉහල පොලී රේට්ටු, නය වර්ධනය වීම මත සියයට 18ක සීමාවක්, විදුලි හා පෙට්‍රෝලියම් මිල ඉහල දැමීම, රුපියලෙහි අගය පහත හෙලීම හා මෙම වසරේ අය වැය පරතරය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.2 දක්වා පහත හෙලීමට ආන්ඩුව පොරොන්දු වීම ජාමූඅ විසින් පැනවූ කොන්දේසි විය.

ඒජන්සියේ පුවත්පත් දැන්වීමට අනුව පැහැදිලි වන්නේ තවත් සමාජ-පිරිහෙලීමේ ක්‍රියා මාර්ග අවශ්‍යව ඇති බවයි. ආන්ඩුව "ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරන" පවත්වා  ගෙන යන අතර තුර රාජ්‍ය සතු බල ශක්ති ව්‍යවසායයන් "වඩා ස්ථායි පිලිවෙලකට" සකස් කල යුතු බව එය කියා සිටියි. වෙනත් වචනවලින් කිවහොත් රැකියා තව දුරටත් කැපීම හා ඉහල විදුලි හා ඉන්ධන ගාස්තු අවශ්‍යව ඇත.

ජාමූඅ හි නිවේදනයට දින දෙකකට පෙර ආන්ඩුව මධ්‍යසාර, සිගරැට් හා ආනයනිත වාහනවල බදු ඉහල දැමීය. මෝටර් සයිකල සඳහා 61 - 100 දක්වා ප්‍රතිශතයකින් ද, කුඩා කාර් සඳහා 200 - 270, විශාල වාහන සඳහා 291 - 300 දක්වා ප්‍රතිශතයකින් ද බදු වැඩි කෙරිනි. 2010දී වාහන ආනයනකරුවන්ගේ දැඩි බලපෑම මත ආනයන බද්ද සියයට 50න් අඩු කර තිබිනි.

ජාමූඅ නිවේදනය නිකුත්කල දින ම ලහි ලහියේ සූදානම් කල ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ රැස්වීමක් ඇමතූ ජනාධිපති මෙන්ම මුදල් ඇමති ද වන මහින්ද රාජපක්ෂ වියදම් තව දුරටත් කැපිය යුතු බව කියා සිටියේ ය. විස්තර නිකුත් කර නැතත් ප්‍රධාන සමාජ සේවාවන් එල්ල කෙරෙනු ඇති බව බලාපොරොත්තු විය හැක. මෑත වාර්තාවන්ට අනුව ගෑස් මිල සියයට 10න් ඉහල දැමීමට ආන්ඩුව සැරසෙයි.

ජාමූඅ හි සපථ කිරීම්වලට ප්‍රතිකූලව ආන්ඩුවේ පටි තද කිරීමේ වැඩ කටයුතු ශ්‍රී ලංකාවේ ආර්ථික ගැටලූ විසඳනවා වෙනුවට අර්බුදය ගැඹුරු කර ඇත. වර්ධන වේගය පහත වැටෙමින් ඇති අතර රුපියලෙහි අගය බිඳ වැටීම දිගටම සිදුවේ. ජනවාරියේ වෙලඳ හිඟය ඉහත වසරට වඩා සියයට 50ට ආසන්න ලෙස ඉහල නගිමින් ඇ. ඩො. බිලියනය කරා ලඟා විය. පෙබරවාරි මුල සිට මේ දක්වා රුපියල සියයට 15න් පහත වැටී ඇති අතර දැන් ඩොලරයක අගය රුපියල් 130ක මට්ටමේ පවතී.

තමන් "මැයි මස සිට තෙල් ආනයනය කිරීමේ බිල්පත් ගෙවීම සඳහා ඩොලර් සැපයීම නවත්වන බව" මාර්තු 29 දින ශ්‍රී ලංකා මහ බැංකුව නිවේදනය කලේය. මෙම ක්‍රියාව මගින් රුපියල මත පීඩනය තව තවත් ඉහල යන අතර ජාමූඅ හි ප්‍රතිව්‍යුහකරන ඉල්ලීම හා අනුයමින් නය බරිත ඛනිජ තෙල් සංස්ථාවට ආන්ඩුවේ සහයෙන් තොරව ක්‍රියාත්මක වීමට බල කෙරේ. ප්‍රතිඵලය නම් තෙල් මිල තවත් වටයකින් ඉහල යාම සහ රැකියා කප්පාදුවයි.

පෙබරවාරියෙහි තෙල් මිල ඉහල දැමීම  ඛනිජ තෙල් සංස්ථාවේ පැවති රුපියල් බිලියන 200 ක නය ප්‍රමානය රුපියල් බිලියන 60 දක්වා පහත හෙලූ බවට භාන්ඩාගාර ලේකම් පී. බී. ජයසුන්දර  උදම් ඇනුවේය.

මෙම බර ඉතාම දරුනු ලෙස පටවනු ලැබුවේ වතු කම්කරුවන් මත හා නාගරික සහ ගම්බද දුගීන් මතය. අවම වශයෙන් ශ්‍රී ලාංකික පවුල් 400,000 ක් වත් ආලෝකය ලබා ගැනීම සඳහා බූමිතෙල් යොදා ගනිති. දස දහස් ගනනක් ධීවරයෝ තම බෝට්ටු දුවවීම සඳහා බූමි තෙල් හා ඩීසල් යොදා ගනිති.

ඉන්ධන මිල ඉහල යාම මගින් ක්ෂනිකව ම ගමනාගමන ගාස්තු ඉහල ගිය අතර අනෙකුත් අත්‍යවශ්‍ය දේ අතරින් පාන් ඇතුලු බේකරි ද්‍රව්‍ය මාර්තු මස තුලදී සියයට 10-15 ප්‍රමානයකින් ඉහල ගියේය. ආන්ඩුව විසින් වැඩි කල බදු ඉවත් කර නොගතහොත් කිරි පිටි ආනයනය කිරීම නතර කරන බවට ආනයන කරුවෝ තර්ජනය කරති.

මෙම වසර සඳහා සියයට 8 ක් ව පැවති වර්ධන ඉලක්කය පසු ගිය මාසයේදී මහ බැංකුව විසින් සියයට 7.2 දක්වා පහත හෙලනු ලැබීය. "අපගේ ප්‍රධාන ගැනුම්කරුවන් ගෝලීය මූල්‍ය අර්බුදය නිසා ඔවුන්ගේ මිලට ගැනීමේ ඉලක්ක පහත හෙලා ඇති තත්වය තුල ඉහල වර්ධන වේගයක් ඉලක්ක කිරීම නුවනට හුරු නැති බව" ප්‍රධාන ආර්ථික විශේෂඥයෙකු *සන්ඩේ ටයිම්ස්* පුවත් පතට මෑතදී ප්‍රකාශ කලේය.

ආන්ඩුවේ ක්‍රියා මාර්ගයන් වෙලඳ ශේෂ හිඟය අඩු කිරීමට දායක විය හැකි වුවත් එමගින් "වෙලඳ හිඟය අතුගා නොදැමෙන බව" *සන්ඩේ ටයිම්ස්* පුවත් පතේ ආර්ථික ලේඛක නිමල් සඳරත්න මාර්තු 24 දින ඔහුගේ තීරුවෙන් කියා සිටියේය. ඉහල දැමුනු බදු හා සේවා ගාස්තු, ප්‍රාග්ධන ගලනය වැඩි කිරීම ආදිය මගින් ආදායම ප්‍රසාරනය කර ගැනීමට දරන ආන්ඩුවේ තැතෙහි ප්‍රතිඵලය ගෝලීය ආර්ථික බැස්ම නිසා අවිනිශ්චිත වී ඇතැයි ඔහු කියා සිටියි.

2010 වසර තුල ශ්‍රී ලංකාවේ වෙලඳ හිඟය වූ ඩොලර් බිලියන 4.9 න් සියයට 84 ක් පියවා ගත්තේ ශ්‍රී ලාංකික කම්කරුවන් එතෙර සිට තම පවුල්වල නඩත්තුවට එවන මුදල්වලිනි. පසුගිය වසරේ වෙලඳ හිඟය ඩොලර් බිලියන 9.7 දක්වා දෙගුන වී ඇති අතර එතෙර සිට එවන මුදල්වලින් පියවා ගත හැකි වන්නේ ඉන් සියයට 53ක් පමනි.

මෙම එතෙර මුදල්වලින් සියයට 60ක ප්‍රභවය වන මැද පෙරදිග, මහජන නැගිටීම් හා භූ ආර්ථික ආතතීන් ඉහල යාම් මතින් ගමන් කරන බැවින් ආදායම පහත වැටෙනු ඇතැයි සඳරත්න පෙන්වා දෙයි. එක්සත් ජනපදය, යුරෝපය හා නැගෙනහිර ආසියාතික රටවලින් ලැබෙන මුදල් ද පහත වැටීමේ අන්තරායට මුහුන දෙන බව ඔහු දක්වයි.

පසු ගිය වසර දෙක තුල ශ්‍රී ලංකාව තුල සංචාරක කර්මාන්තයේ ලාභ ඉහල ගොස් ඇතත් මෙම ආදායමට ද ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවන් මගින් බාධා කෙරෙනු ඇතැයි සඳරත්න කියා සිටියි.

කොලඹ කොටස් වෙලඳ පල 2010 දී ලෝකයේ " ඉහලම ප්‍රතිඵලදායී කොටස් වෙලඳ පල" ලෙසට ජාත්‍යන්තර දර්ශක මගින් ගනන් බැලූනු බව රාජපක්ෂ ආන්ඩුව ඉහතදී උදම් ඇනීය. කෙසේ වතුදු 2011 මැද සිට කොටස් වෙලඳ පල දර්ශකය ශීඝ්‍රයෙන් පහත වැටුනු අතර මෙම වසරේ ජනවාරි හා පෙබරවාරි වන විට එය 5,000 දක්වා පහත වැටිනි.

ජාමූඅ හි මෑතම වටයෙහි ඉල්ලීම් ද කොලඹ ආන්ඩුව විසින් සුවච කීකරු ලෙස ක්‍රියාවට දමනු ලබනු ඇති අතර එමගින් නොවැලැක්විය හැකි ලෙස ම ආන්ඩු විරෝධී අරගල නව වටයක් ඇති කෙරෙනු ඇත. රාජපක්ෂ තන්ත්‍රය දැනටමත් කම්කරුවන්ට හා ගම්බද මහජනයාට එරෙහිව පොලිස් රාජ්‍ය සැලසුම් හා දෘෂ්ටිවාදාත්මක උද්ඝෝෂනයක් සූදානම් කරමින් ඇත. දිවයිනේ ජාතියට එරෙහිව "බටහිර කුමන්ත්‍රනයක්" පවතින බව කියා සිටිමින් ඕනෑම විරෝධතාවක් ජාති ද්‍රෝහී යැයි ආන්ඩුව විසින් හංවඩු ගසනු ලබයි.

© www.wsws.org